**ශ්‍රම වාසනා අරමුදල - 2019**
**------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ශ්‍රම වාසනා අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණන කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 53 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පැනනැගුනු රු.306,348 ක් වූ ප්‍රත්‍යාගණන අලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ පෙන්විය යුතු වුවත් එලෙස සිදුනොකර පෙර වර්ෂ ගැලපුම් ලෙස සමුච්චිත අරමුදලෙන් ගලපා තිබූ වාර්ෂික අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ප්‍රත්‍යාගණන සංචිත ගිණුම හරහා ප්‍රත්‍යාගණන අලාභය කපා හැර ඉතිරිය ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙන් අඩු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන ගිණුම් තැබීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව සිදුකල යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ස්ථාවර වත්කම්වල එලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිරිවැය රු.430,420 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ප්‍රත්‍යාගණනය කළ යුතු වත්කම් තීරණය කිරීමෙන් පසුව වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. 2019 වර්ෂය තුලදී සියලුම වත්කම් කාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම සිදු කළ නිසා ඉදිරියේදී ක්ෂය වී අවසන් වීමට පෙර අදාළ සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු සිදු කරනු ඇත. | ක්ෂය වී අවසන් වත්කම්වල ජීව කාලය නැවත සමාලෝචනය කිරීමට අරමුදල කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශ විසින් 2019 වර්ෂය තුලදී අරමුදල වෙත පවරා දී තිබූ රු.3,500,000 ක් වූ මෝටර් රථයක් හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවරා දී තිබූ රු.125,500 ක් වූ ලීබඩු උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනානොගෙන, පෙර වර්ෂ ගැලපුම් ලෙස සමුච්චිත ලාභයට ගලපා තිබුණි. | කම්කරු අමාත්‍යාංශයෙන් 2019 වර්ෂයේදී පවරා දුන් රු.35,000,000/-ක් වූ KO 7519 දරන කාර් රථය සහ කම්කරු දෙපාර්තමේන්තුවෙන් පවරා දුන් රු.125,500/-ක් වටිනා ලී බඩු හා උපකරණ පෙර වර්ෂයේ ගැලපුම් කිරීමේදී ප්‍රාග්ධනයෙන් ඉවත් කර රජයේ පරිත්‍යාග ලෙස වෙනම ගිණුමකට ගළපා වත්කම් වල ක්ෂය වීම් ද එම ගිණුමෙන් ඉවත් කොට වර්ෂය අවසාන ශේෂය සංචිතය ලෙස පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | පවරාගත් වත්කම් පිළිබඳ පවත්නා ගිණුම්කරණ පරිචය ප්‍රකරව නිසි පරිදි ගිණුම් තැබීමට අරමුදල කටයුතු කල යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ කාරක ප්‍රාග්ධන ගැලපීම් ලෙස ස්ථාවර තැන්පතු රු.2,692,741 ක වටිනාකම සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු කිරීමක් ඉදිරිපත් නොවුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගනු ලබන වර්ෂයේ අතිරික්තයෙන් පාලන ගිණුමක් පවත්වාගෙනයාම තුලින් ගණනය කරන ලද වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම අඩු කිරීමක් සිදුවන නිසා සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී ප්‍රවර්ථන වර්ෂයේ සහ පෙර වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ගිණුම් අතර වෙනසද කාරක ප්‍රාග්ධන අඩුවැඩිවීම් යටතේ දක්වන නිසාත් රු.2,692,742.10 ක ස්ථාවර තැන්පතු පොලී ආරම්භක හා අවසාන ශේෂ නැවත වරක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් අඩු කිරීමක් සිදුවේ. එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුලනය වීම කෙරෙහි බලපාන බැවින් ඉහත මුදල කාරක ප්‍රාග්ධනයට සිදු කරන ගැලපීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අතිරික්තයට එකතු කරන ලදී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) 7.9.9 මාර්ගෝපදේශය | ඩෙස්ක්ටොප් පරිගනක 3 ක් රු.565,405 කට මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුත්තේදී අවම මිල ඉදිරිපත් කල ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම සඳහා අරමුදල විසින් තාක්ෂණික කරුණු සම්බන්ධව ලංසුකරුවෙකුගෙන් වාචිකව පැහැදිලි කිරීම් ලබාගෙන තිබුණද මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි ලිඛිත පැහැදිලි කිරීම් ලබාගෙන නොතිබුණි. | ඩෙස්ක්ටොප් පරිගණක මිලදී ගැනීමේදී ආයතන 11 ක් සඳහා මිල කැඳවුම් ලිපි යොමු කරන ලද අතර ආයතන 04 කින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.එම මිල ගණන් අතරින් අවම මිල ඉදිරිපත් කර තිබු ආයතනය. එක් පරිගණකයක් රු.124,500.00 ලෙසයි. තවද අනෙකුත් සියලු ආයතන ඉදිරිපත් කල මිල ගණන් හා සසඳන විට මෙම ආයතනයේ මිල ගණන් වල රු.35,000 පමණ වෙනසක් තිබූ නිසා ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රසම්පාදන කමිටුව සහ සාමාන්‍යාධිකාරීතුමාගේ වාචික උපදෙස් පරිදි තාක්ෂණ කමිටුව ඉදිරියේ දී විෂය භාර නිලධාරියා විසින් එම ආයතනයට දුරකථන ඇමතුමක් ලබා දී තාක්ෂණික පිරිවිතර පිළිබඳ වැඩිදුර විස්තර විමසන ලදී. එවිට එම ආයතනය මඟින් ප්‍රකාශ කර සිටියේ එම ලියවිලි සැකසූ නිලධාරියා විසින් පිරිවිතර සියල්ල සපයන බවට ලකුණු කර එවා තිබුණත් මිල ගණන් සකසන විට Microsoft Office Package (Lifetime) යන මෘදුකාංගයට අදාළ මිල ගණන් එකතු කර නොතිබූ බවයි. | අරමුදල විසින් ප්‍රසම්පාදන කටයුතු වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ii) 3.4.3 (ඇ) මාර්ගෝපදේශය | ලියාපදිංචි සැපයුම්කරුවන් සිටියදී ඊට පරිබාහිර ආයතනවලින් රු.127,700 ක භාණ්ඩ මිලට ගෙන තිබුණි. | කෙටි ආහාර නිෂ්පාදනයට හා LED බල්බ් නිෂ්පාදනයට අදාලව මිල ගණන් කැඳවීමේදී අදාල උපකරණ කට්ටලයම සපයනු ලබන ආයතන Yellow pages, Rainbow pages තුල තිබූ හෙයින් ලියාපදංචි කර තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ්‍ය (විවිධ) නීතිගත සංස්ථාවෙන් සහ වෙනත් ආයතන වලින් මිල ගණන් කැඳවන ලදී.<br>ජංගම සේවයට අදාල සියලුම මුද්‍රණ කටයුතු එකම ආයතනයකින් සිදුකර ගැනීම සුදුසු බව ජංගම සේවයට අදාල මූලික රැස්වීමකදී අමාත්‍යාංශ | අරමුදල විසින් ප්‍රසම්පාදන කටයුතු වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලේකම්තුමා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මුද්‍රණ කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් රේන්බෝ පිටුවල සඳහන් ආයතන මගින් මිල ගණන් කැඳවීම සිදුකර තිබූ බැවින් ශ්‍රම වාසනා අරමුදල විසින් එම ආයතනය මගින් අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර් මුද්‍රණයටද මිල ගණන් කැඳවන ලදී. | |
| (ආ) | 2015 ජුනි 17 දිනැති අංක PED 3 / 2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.1 ඡේදය | අරමුදලේ සේවයේ නියුතු විධායක අධ්‍යක්ෂවරුන්ට සහ සභාපතිට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා ලබා ගත නොහැකි වුවත් එයට පටහැනිව 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක් සඳහා සහභාගීවීම වෙනුවෙන් පැමිණීමේ දීමනා ලෙස රු.42,000 ක් සභාපතිවරයා වෙත ගෙවා තිබුණි. | හිටපු අමාත්‍යාංශ ලේකම් මේ වන විට විශ්‍රාම ගොස් ඇති අතර මේ වන විට ඔහුගෙන් මුදල් ආපසු අය කිරීම සාධාරණ නොවන බව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එසේ වුවද 2020 ජනවාරි මස සිට සභාපති සඳහා වන පැමිණීමේ දීමනාව ලබා නොගනී. | අරමුදල විසින් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මගපෙන්වීම් හා උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 21,832,738 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 19,238,038 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,594,700 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලොතරැයි ආදායම රු. 10,004,734 කින් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදල විසින් ඉටු කල යුතුව තිබූ කාර්යභාරයන් අතරින් රු.මිලියන 2.41 ක් වෙන් කල කාර්යභාරයන් 7 ක් ඉටුකර නොතිබුණි. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඉහත වැඩසටහන්වල ස්වරූපය (Nature) සහ විෂය පථයේ පැවති දුර්වලතා හේතුවෙන් ක්‍රියාත්මක කල නොහැකිව තිබුණද කළමනාකරණය විසින් ඒ පිළිබඳ සැලකිල්ලට නොගෙන දිගින් දිගටම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් කර තිබුණි. | 2018/2019 වර්ෂ වලදී ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වූ වැඩසටහන් පිළිබඳ විටින් විට කිහිපවරක් අයදුම්පත් නොලැබීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී.ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කමිටුවක් පත් කර එහි වාර්තාව මේ වන විට ලේකම් තුමා වෙත යවා ඇති අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට බලාපොරොත්තු වේ. | සැලසුම්කරණ ලද වැඩසටහන් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අරමුදල හැකි සෑම උත්සාහයක්ම ගතයුතු අතර ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ළඟාකර ගැනීමටද කටයුතු කල යුතු වීම. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වෛද්‍ය සහනාධාර සැපයීම, කෘතිම අත්පා බෙදාදීම් හා ලොතරැයි විකුණුම් වැඩිකිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 85 ක් වූ අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3.3 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂ අවසානයට එම වැඩසටහන් 15 ක් පමණක් පවත්වා තිබූ අතර රු.මිලියන 1.3 ක් වැයකර තිබුණි. ඒ අනුව භෞතික කාර්යසාධනය සියයට 17 ක් වුවද මූල්‍ය කාර්යසාධනය සියයට 39 ක් බව නිරීක්ෂණය විය. | 2018/2019 වර්ෂ වලදී ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වූ වැඩසටහන් පිළිබඳ විටින් විට කිහිපවරක් අයදුම්පත් නොලැබීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කමිටුවක් පත් කර එහි වාර්තාව මේ වන විට ලේකම් තුමා වෙත යවා ඇති අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට බලාපොරොත්තු වේ. | සැලසුම්කරන ලද වැඩසටහන් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අරමුදල හැකි සෑම උත්සාහයක්ම ගතයුතු අතර ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීමටද කටයුතු කල යුතු වීම. |